රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 08/2010

මගේ අංකය:- EST-7/TPORT/05/5120
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2010.05.24

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

<u>රාජ්‍ය වියදම් කළමනාකරණය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ අමතන ලද ජනාධිපති ලේකම්ගේ අංක සීඑ/1/17/1 හා 2010.05.14 දිනැති ලිපියේ 3.5 උප ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව ගරු අමාත්‍යවරුන්ගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ පහත සඳහන් නිලධාරීන්ට සපයා ඇති නිල වාහන වෙනුවෙන් මාසික ඉන්ධන දීමනාවක් පහත සඳහන් උපරිමයන්ට යටත්ව ගෙවනු ලැබේ.

| හිමිකම් ලබන නිලධාරීන් | පෙට්‍රල් / ඩීසල් වාහන සඳහා මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය |
|---|---|
| පෞද්ගලික ලේකම් | 240 |
| සම්බන්ධීකරණ ලේකම්/ මාධ්‍ය ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී | 218 |

03. ඉන්ධන දීමනාව බිල්පත් මත කරනු ලබන ප්‍රතිපූර්ණයක් ලෙස නොව මාසික දීමනාවක් ලෙස ගෙවිය යුතුය. අදාළ මාසයේ පළමුවන දින දේශීය වෙළඳ පොළෙහි පවතින ඉන්ධන මිල අනුව ඉන්ධන දීමනාව තීරණය කළ යුතු වේ.

04. ඉහත නිලධාරීන්ගේ නිල වාහනවලට අනුයුක්ත කර ඇති රියදුරන්ට පහත සඳහන් උපරිමයන්ට යටත්ව අතිකාල හා සංයුක්ත දීමනා ගෙවිය යුතුය.

| නිල වාහන අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ තනතුර | මාසික අතිකාල දීමනා උපරිමය පැය | මාසික සංයුක්ත දීමනා උපරිමය දින |
| --- | --- | --- |
| ගරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් | **125** | **09** |
| ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් | **100** | **06** |
| ගරු ඇමතිතුමාගේ සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්/ මාධ්‍ය ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී | **100** | **06** |

**05.** ඉහත දැක්වූ ඉන්ධන දීමනා, අතිකාල සහ සංයුක්ත දීමනා උපරිම සීමාවන් ඉක්මවා වියදම් දැරීමට හෝ ඒ සඳහා වැය කරන අතිරේක වියදම් පියවීමට හෝ බිල්පත් ඉදිරිපත් නොකලයුතු බව ද අවධාරණය කරමි.

ඩී.දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය